අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK - 11 ශ්‍රේණිය

බුද්ධ ධර්මය - 1 පත්‍රය කාලය පැය 01

ප්‍රශ්න 40 කට පිළිතුරු සපයන්න

1. බෞද්ධයාගේ අත්පොත වන්නේ
   1 ) සද්ධර්ම රත්නාවලියයි 11 ) පූජාවලියයි 111 ) ත්‍රිපිටකයයි 1v ) ධම්මපදයයි
2. ධම්මපදයේ ඇති ගාථා ගණන වන්නේ
   1 ) 350 කි 11 ) 260කි 111 ) 423 කි 1v ) 400 කි
3. සිත සංවර කර ගැනීමටත් ධ්‍යාන ලබා ගැනීමටත් උපකාරී වන භාවනාව
   1 ) මෛත්‍රී භාවනාවයි 11 ) සමථ භාවනාවයි
   111 ) විදර්ශනා භාවනාවයි 1v ) ආනාපාන සති භාවනාවයි
4. විචිකිච්ඡාව යනු
   1 ) සැකයයි 11 ) සිතේ ඇතිවන උදාසීන ගතියයි
   111 ) කෝපයයි 1v ) කාම වස්තූන් කෙරෙහි ඇති ආශාවයි
5. සමථ භාවනාවේදී උපයෝගී කරගන්නා කර්මස්ථාන ගනන
   1 ) 20 කි 11 ) 60 කි 111 ) 40 කි 1v ) 30 කි
6. හේතු ඵල දහම පිළිබඳව කියවෙන්නේ
   1 ) ත්‍රි ලක්ෂණයෙනි 11 ) ත්‍රි ශික්ෂාවෙනි
   111 ) චතුරාර්ය සත්‍යයෙනි 1v ) පටිච්ච සමුප්පාදයෙනි
7. මානව සමාජය සිව් ආකාරයැයි බුදු රජානන් වහන්සේ දේශනා කර තිබේ මෙයට අයත් නොවන්නේ
   1 ) නිරි සතුන් සේ සිටින මිනිස්සු 11 ) දෙවියන් සේ සිටින මිනිස්සු
   111 ) තිරිසනුන් සේ සිටින මිනිස්සු 1v ) මිනිසුන් සේ සිටින මිනිස්සු
8. සදිශා නමස්කාරය පිළිබඳව බුදු රජානන් වහන්සේ දේශනා කලේ
   1 ) අජාසත්ත රජතුමාට 11 )යසකුල පුත්‍රයාට 111) සිගාලක ගෘහපතිට 1v )රාහුල කුමාරයාට
9. සිගාලෝවාද සූත්‍රයට අනුව මිල මුදල් ආදිය විනාශ නොකිරීම
   1 ) භාර්යාවගේ යුතුකමකි 11 ) ස්වාමි පුරුෂයාගේ යුතුකමකි
   111 ) දෙමව්පියන්ගේ යුතුකමකි 1v ) දරුවන්ගේ යුතුකමකි
10. බුදු බව ලබා ගැනීමට පුහුණු කල යුතු පාරමිතාව නම්
    1 ) පාරමී තත්වයයි 11 ) උප පාරමී තත්වයයි
    111 ) පරමත්ථ පාරමී තත්වයයි 1v ) වීර්ය පාරමී තත්වයයි
11. නෙක්කම්ම පාරමිතාවට උදාහරණ ලෙස ගතහැකි ජාතක කථාව නම්
    1 ) මඛාදේව ජාතකයයි 11 ) උම්මග්ග ජාතකයයි
    111 ) තේමිය ජාතකයයි 1v ) වණ්ණුපථ ජාතකයයි
12. ආවේගශීලී නොවී කටයුතු කිරීම දසරාජ ධර්මයෙහි හැඳින්වෙන්නේ
    1 ) ඉවසීම ලෙයසි 11 ) තපස ලෙයසි 111 ) අක්‍රෝධය ලෙයසි 1v ) අවිහිංසාව ලෙයසි
13. සප්ත අපරිහානිය ධර්ම බුදු රජාණන් වහන්සේ විසින් හඳුන්වා දෙනු ලැබුයේ
    1 ) ශාක්‍ය කෝලීය දෙපිරිසට 11 ) බිම්බිසාර රජතුමාට
    111 ) කොසොල් රජතුමාට 1v ) වජ්ජි රජ දරුවන්ට
14. සතර අගති වලට අයත් නොවන්නේ

1 ) ඡන්දය 11 ) ලෝභකම 111 ) භය 1v ) මෝහය

15. පෙර ආත්ම භාවය දැකීමේ නුවණ හැඳින්වෙන්නේ
1 ) චුතූපපාත ඥානය 11 ) ආසවක්ඛය ඥානය
111 ) පුබ්බේ නිවාසානුස්සති ඥානය 1v ) විදර්ශනා ඥානය

16. සමාජයේ මිනිස්සු උස් පහත් වශයෙන් වෙනස්ව උපදින්නේ, ඇයි ? මෙසේ ප්‍රශ්ණයක් ඇතිවූයේ
1 ) කොසොල් රජතුමාට 11 ) යසකුල පුත්‍රයාට 111 ) සුභ නම් තරුණයාට 1v) රාහුල කුමාරයාට

17. කර්මය විපාක වශයෙන් ගත්පිට ප්‍රාණඝාතය කරන්නා
1 ) අඩු වයසින් මියයති 11 ) රෝගී වේ 111 ) පහත් අයෙක් වේ 1v ) අනුවණයෙක් වේ

18. කර්ම විපාක පිළිබඳව දැක්වෙන සූත්‍රය
1 ) පත්තකම්ම සූත්‍රය 11 ) චූල්ල කම්ම විභංග සූත්‍රය 111) අරිය පරියේශන සූත්‍රය 1v) චූල්ල රාහුලෝවාද

19. ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමන් උපත ලැබුවේ
1 ) 1869 11 ) 1866 111 ) 1867 1v ) 1864 වර්ෂයේදීය

20. බුදු රජානන් වහන්සේ බරපතලම රෝගයක් ලෙස දක්වා ඇත්තේ
1 ) දියවැඩියාවයි 11 ) උදරා බාධයයි 111 ) කුස ගින්නයි 1v ) අමතක වීමයි

21. රෝගාබාධ නිසා ඇතිවන දුක බුදු දහමෙහි දක්වා ඇත්තේ
1 ) ජාති දුවශයෙනි 11 ) ජරා දුක වශයෙනි 111 ) ව්‍යාධි දුක වශයෙනි 1v ) අනිත්‍ය දුක වශයෙනි

22. පළමු ධර්ම සංගායනාව පැවැත්වූයේ
1 ) රජ ගහනුවර 11 ) විශාලා මහනුවර 111 ) පැලලුප් නුවර 1v ) සැවැත්නුවර

23. තුන්වන ධර්ම සංගායනාව පැවැත්වූයේ බුද්ධ පරිනිර්වාණයෙන්
1 ) අවුරුදු 250 කට පසුය 11 ) අවුරුදු 233 කට පසුය
111 ) අවුරුදු 245 කට පසුය 1v ) අවුරුදු 236 කට පසුය

24. මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවන් විසින් පරවාද පන්සියයක් හා ඒවා ඛණ්ඩනය කිරීමට සකවාද පන්සියයක් ඇතුලත් කරමින් රචිත ග්‍රන්ථය
1 ) පූජාවලිය 11 ) නිකාය සංග්‍රහය 111 ) කථාවත්ථුප්පකරණය 1v ) ත්‍රිපිටකය

25. ධර්මාශෝක රජුගේ අවධියේ දුසිල්වත් භික්ෂූන් සමග සුසිල්වත් භික්ෂූන් වහන්සේලා පොහොය කර්ම කිරීමට අකමැති බැවින් පොහොය කර්ම නොකර ගතකල කාලය
1 ) අවු 6 කි 11 ) අවු 8 කි 111 ) අවු 12 කි 1v ) අවු 7 කි

26. මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ පිරිස ලංකාවට වැඩම කර ප්‍රථමයෙන් දෙසූ ධර්ම දේශනාව
1 ) ආසීවිසෝපම සූත්‍රය 11 ) කාලාම සූත්‍රය
111 ) බ්‍රහ්මජාල සූත්‍රය 1v ) චූල්ල හත්ථිපදෝපම සූත්‍රය

27. හතරවන ධර්ම සංගායනාව පැවැත්වූයේ
1 ) දුටුගැමුණු රජ දවස 11 ) මහසෙන් රජ දවස
111 ) වළගම්බා රජ දවස 1v ) පණ්ඩුකාභය රජු දවස

28. දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා අයත් නොවන කරුණ
1 ) සතර අගතියෙන් වැලකීම 11 ) සතර ඍද්ධි පාද
111 ) සතර සංග්‍රහ වස්තු 1v ) සප්ත අපරිහානිය ධර්ම

29. යම් යම් දෑ පිළිබඳව ඇති පුද්ගල කැමැත්ත සතර අගති වලදී හඳුන්වන්නේ
1 ) ඡන්දය 11 ) මෝහය 111 ) භය 1v ) ද්වේෂය

30. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා ආජීවයෙන් දැක්වෙන්නේ
1 ) යහපත් ක්‍රියායි 11 ) යහපත් වචනයයි 111 ) යහපත් දිවි පැවැත්මයි 1v )යහපත් උත්සාහයයි

31. දළදා වහන්සේ ලක්දිවට වැඩම කරනු ලැබුවේ

1 ) පරාක්‍රමබාහු රජු දවස 11 ) 1 වන විමලධර්මසූරිය රජු දවස

111 ) මහසෙන් රජු දවස 1v ) කිත්සිරි මෙවන් රජු දවස

32. දුටුගැමුණු රජතුමා ඉදිකල චෛත්‍යයක් වන්නේ

1 ) මිරිසවැටිය 11 ) ථූපාරාමය 111 ) අභයගිරිය 1v ) ජේතවනාරාමය

33. දෙව්රම් වෙහෙර ඉදිරිපිට ආනන්ද බෝධීන් වහන්සේ රෝපනය කරන ලද්දේ

1 ) බෝධීන් වහන්සේට වැඳුම් පිදුම් කිරීමට 11 ) කෘතගුණ සැලකීමට

111 ) බුදුරජානන් වහන්නේ නොමැති විට පැමිණෙන පිරිස් සඳහා වැඳුම් පිදුම් කිරීමට

1v ) දෙව්රම් වෙහෙරේ බෝධියක් නැති බැවිනි

34. දිළිඳු ජනයාට ධනය ලබා දෙමින් රැක බලා ගැනීම මෙම රාජ්‍ය පාලකයෙකුට අයත් පිළිවෙත හඳුන්වා දී ඇත්තේ

1 ) දස රාජ ධර්මවලය 11 ) සප්ත අපරිහානිය ධර්මවලය 111 ) දස සක්විති වත්තුලය 1v )දස කුසල්වලය

35. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වායාම ලෙස හඳුන්වන්නේ

1 ) යහපත් වචනයයි 11 ) යහපත් ක්‍රියායි 111 ) යහපත් උත්සාහයයි 1v ) යහපත් දැකීමයි

36. ධනය පරිභෝජනය කිරීමේදී ණය නැතිකම හේතුවෙන් සිතට දැනෙන සුවය

1 ) අත්ථි සුඛයයි 11 ) භෝග සුඛයයි 111 ) අණන සුඛයයි 1v ) අනවජ්ජ සුඛයයි

37. මාගේ මේ ව්‍යායාමය රජ සැප පිණිස නොව බුද්ධ ශාසනයේ චිර පැවැත්ම උදෙසාය මෙසේ ප්‍රකාශ කලේ

1 ) දුටුගැමුණු රජතුමා 11 ) මහා පරාක්‍රමබාහු රජතුමා

111 ) දේවානම් පියතිස්ස රජතුමා 1v ) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

38. තමාට හානිය පිණිස පවතින අනුන්ට හානිය පිණිස පවතින තමන් හා අනුන් යන දෙපිරිසටම හානිය පිණීස පවතින ක්‍රියාවලින් වැලකීමට උපදෙස් දුන්නේ

1 ) රාහුල කුමාරයාට 11 ) නන්ද කුමාරයාට 111 ) දෙව්දත් තෙරුන්ට 1v )ආනන්ද හාමුදුරුවන්ට

39. ලෝක පාලක ධර්ම යනු

1 ) පව් කිරීමට ඇති ලැජ්ජාව හා බියයි 11 ) ලෝභය හා ද්වේෂයයි

111 ) සීලය හා සමාධියයි 1v ) තණ්හාව හා ආශාවයි

40. පන්සිය පනස් ජාතක පොත රචනා කරන ලද්දේ

1 ) කුරුණෑගල යුගයේදීය 11 ) අනුරාධපුර යුගයේදීය

111 ) පොලොන්නරු යුගයේදීය 1v ) කෝට්ටේ යුගයේදීය

www.eduLanka.LK



ඉස්කෝලේ edulanka.lk

අවසාන වාර පරීක්ෂණය 11 ශ්‍රේණිය

බුද්ධ ධර්මය - 11 පත්‍රය කාලය පැය 2 යි

පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න

1. සීල සමාදාන පිංකමේදී ඔබ භාවනා කළ අයුරු සිහියට නගාගන්න
   1 ) නිවන් ලබාගැනීපට උපකාරී වන භාවනාව කුමක්ද ?
   11 ) සිත සන්සුන් කරගැනීමට ධ්‍යා ලබා ගැනීමට උපකාරී වන භාවනාව කුමක්ද ?
   111 ) සමථ භාවනාවට භාවිතා කරන තවත් ලියන්න
   1v ) සමථ භාවනාවේදී යොදාගන්නා හෙවත් කමටහන් ගණන කීයද ?
   v ) පුද්ගල චරිත කොටස් කීයකට බෙදිය හැකිද ?
   v1 ) භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න
   v11 ) භාවනා කිරීමෙන් නීවරණ ධර්ම කීයක් යටපත් වෙයිද ?
   v111 ) බුදු රජානන් වහන්සේ ව්‍යාපාදය උපමා කලේ කුමන වතුරකටද ?
   1x ) පන්සලකට ගොස් වන්දනා කරන අනු පිළිවෙල ලියන්න
   x ) ඔබේ ජීවිතයේ දුක්බර අවස්ථාවකට ඔබ සාර්ථකව මුහුණ දුන් අයුරු ඉතා කෙටියෙන් ලියන්න

2. 1 ) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් දිශා හය නම් කරන්න
   11 ) සිසුන් විසින් ගුරුවරුන් වෙනුවෙන් ඉටුකල යුතු යුතුකම් මොනවාද ?
   111 ) දෙමව්පියන්ගෙන් දරුවන්ටත් දරුවන්ගෙන් දෙමව්පියන්ටත් යුතුකම් ඉටු නොවීම තුලින් ඇතිවන ගැටළු මොනවාද ?

3. 1 ) සෑම පාරමිතාවක්ම කොටස් 3 කට බෙදේ එම කොටස් තුන මොනවාද ?
   11 ) අ ) බුදු රජානන් වහන්සේ වීර්ය පාරමිතාව පිරූ ආකාරය පිළිබඳව ජාතක කථාව කුමක්ද ?
   ආ ) ප්‍රඥා පාරමිතාව පිරූ ආකාරය දැක්වෙන ජාතක කථාව කුමක්ද ?
   111 ) දස පාරමිතා ( බුද්ධ කාරක ධර්ම ) වලින් හතරක් ලියන්න

4. 1 ) දැහැමි රාජ්‍ය පාලනයකට අදාල බෞද්ධ ඉගැන්වීම් තුනක් ලියන්න
   11 ) දස රාජ ධර්ම වලින් හතරක් හඳුන්වන්න
   111 ) ඔබ පාසලේ ශිෂ්‍ය නායකයකු යැයි සිතා ඔබ තුල වර්ධනය කරගත හැකි නායකත්ව ගුණාංග මොනවාදැයි ලියන්න

5. 1 ) අ ) තුන්වන ධර්ම සංගායනාව පැවැත්වූයේ බුද්ධ පරිනිර්වානයෙන් කොපමන කලකට පසුවද ?
   ආ ) තුන්වන ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය කුමක්ද ?
   11 ) තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු මොනවාද ?
   111 ) තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල මොනවාද ?

6. 1 ) නිරෝගී ජීවිතයක් සඳහා බුදුරජානන් වහන්සේ දුන් උපදෙස් මොනවාද ?
   11 ) නිරෝගී ජීවිතයකට අපට අනුගමනය කළ හැකි පිළිවෙත් මොනවාද ?



ඉස්කෝලේ edulanka.lk

111 වර්තමානයේ පැතිර යන ඩෙංගු රෝගය මර්ධනය සඳහා පාසල් ශිෂ්‍යයෙකු ලෙෂ ඔබට දායක වියහැකි ආකාරය ලියන්න

www.eduLanka.LK